# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2226/51 – 2021 මැයි මස 06 වැනි බ්‍රහස්පතින්දා – 2021.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. තිස්ස යාපා මයා, අංක 292, ගැමුණු මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,


1A – G 34306 – 25 (2021/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බණ්ඩාරවෙල, මීරියගහ, උඩපේරුව පාර, කුමුදුනී, නීතිඥ ජයසේකර මුදියන්සේලාගේ කපිල ජයසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2019/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. තිස්ස යාපා මයා, අංක 292, ගැමුණු මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සේවය කරන ලද ඩී. තිස්ස යාපා මහතාගේ විනයානුකූල පරීක්ෂණයේ දී 2011.01.01, 2012.01.01, 2013.01.01 හා 2014.01.01 වර්ෂවල වැටුප් වර්ධක විලම්භනය කිරීමට ලබාදෙන ලද තීන්දුව මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ සිදුවී තිබේනම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05 - 351

---

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිශ්ශංක මයා, අංක 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහවීදිය, මොරටුව. 2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, අංක 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල. 3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, අංක 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11 - 2/1, රොඩ්නි පාර, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, මයිටිපේ 1 වන මාවත, අංක 31, පියසේන ජී. පුස්සාවල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිශ්ශංක මයා, අංක 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහවීදිය, මොරටුව. 2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, අංක 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල. 3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, අංක 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11 - 2/1, රොඩ්නි පාර, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කර ඇති ටී. ඒ. දමිත් නිශ්ශංක, යූ. ඩී. හර්ෂණ අබේරත්න හා එස්. ඒ. තිලංග සුදර්ශන යන සේවකයින්ට ගෙවමින් තිබූ වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව 2018 සැප්තැම්බර් මස සිට නොගෙවීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේද? සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05 - 352

මගේ අංකය: IR/COM/01/2018/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

එල්. ආර්. ජයරත්න මයා, 34 කණුව, පතානයාය, ඌව කුඩාඔය.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ෂුගර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, පයිෆ් පාර, අංක 34/8, නීතිඥ උදේන ගුණසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එල්. ආර්. ජයරත්න මයා, 34 කණුව, පතානයාය, ඌව කුඩාඔය.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ෂුගර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ෂුගර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනයේ වගා ආරක්ෂක අංශයේ අනියම් කම්කරුවකු

ලෙස සේවය කළ එල්. ආර්. ජයරත්න මහතාගේ සේවය 2014.09.17 වන දින සිට අවසන් කිරීම සාධාරණ හා යුක්ති සහගත ද? එසේ නොවන්නේ නම් සේවකයාට හිමිවිය යුතු සහන මොනවාද? යන්න පිළිබඳව වේ.''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05 - 353

---

මගේ අංකය: IR/20/21/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලුපාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, වාද්දුව, ලංකාරාම පාර, අංක 30/08, නීතිඥ අරුණ කාන්ත ජයකොඩි මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/20/21/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලුපාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට 1983 - 1986, 1987 - 1994 හා 1994 න් පසු වශයෙන් බඳවා ගෙන ඇති ලිපිකරු සේවක කණ්ඩායම් අතර වැටුප් විෂමතාවයක් තිබේ ද? යන්න හා එසේ වැටුප් විෂමතාවයක් තිබේ නම් 1986 වර්ෂයට පසුව බඳවාගත් ලිපිකරුවන්ට අසාධාරණයක් සිදුවී තිබේද ? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් කුමන සහන, කුමන ආකාරයෙන් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05 - 354